# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

# இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

EDB SRI LANKA

## කර්මාන්ත හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය

**2026 පෙබරවාරි මස 14 දින සිට 18 දින දක්වා ඉන්දියාවේ නව දිල්ලි හිදී පැවැත්වීමට නියමිත "ඉන්දියානු හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය (IHGF) 2026" නැරබීම සඳහා අධ්‍යයන චාරිකාව සහ මුම්බායි හිදී පැවැත්වීමට නියමිත ව්‍යාපාරික සැසිය සඳහා සහභාගිත්වය.**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) නවදිල්ලියේ ශ්‍රී ලංකා මහකොමසාරිස් කාර්යාලය හා මුම්බායි හි ශ්‍රී ලංකා කොන්සල් ජෙනරල් කාර්යාලය සමග සහයෝගිතාවයෙන්, නවදිල්ලියේ දී 2026 පෙබරවාරි 14 දින සිට 18 දින දක්වා පැවැත්වීමට නියමිත, IHGF දිල්ලි ප්‍රදර්ශනය සඳහා අධ්‍යයන / ක්ෂේත්‍ර චාරිකාවක්, හස්ත කර්මාන්ත, ත්‍යාග භාණ්ඩ හා ගෘහ අලංකරණ නිෂ්පාදන ආශ්‍රිත ශ්‍රී ලාංකික නිෂ්පාදකයින්ගේ සහභාගිත්වයෙන් සංවිධානය කිරීමට යෝජනා කර ඇත.

දිල්ලියේ පැවැත්වෙන IHGF ප්‍රදර්ශනය යනු හස්ත කර්මාන්ත, ගෘහ අලංකරණය හා ත්‍යාග භාණ්ඩ සඳහා වන වඩාත් ජනප්‍රිය වෙළඳ ප්‍රදර්ශනය වන අතර, එය ගෝලීය ගැනුම්කරුවන් සඳහා ඉන්දියානු හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ නිෂ්පාදන ඉදිරිපත් කිරීමේ ඉන්දියාවේ විශාලතම ප්‍රදර්ශනය ලෙස කටයුතු කරයි. එසේම මෙය, ගැනුම්කරුවන් හා විකුණුම් කරුවන් ව්‍යාපාරික වශයෙන් සම්බන්ධ වන වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරයි.

**අරමුණු :**

- නවෝත්පාදන හා නව්‍ය නිෂ්පාදන හා තාක්ෂණ පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- ව්‍යාපාරික සබඳතා ගොඩනැගීම සඳහා අවස්ථාව.
- වර්තමාන කර්මාන්ත ප්‍රවණතා හා සංවර්ධනයක් සම්බන්ධව අවබෝධයක් ලබා ගැනීම.
- අත්කම්, තෑගි භාණ්ඩ හා ගෘහ අලංකරණ අංශයෙහි තිරසාර හා පරිසර හිතකාමී භාවිතයන් පිළිබඳව ගවේෂණය කිරීම

**කවුරුන් සඳහාද :**

- හස්ත කර්මාන්ත, ත්‍යාග භාණ්ඩ හා ගෘහ අලංකරණ ක්ෂේත්‍ර වල නිෂ්පාදකයන් / අපනයනකරුවන් / අපනයන විභවයක් සහිත ආනයනකරුවන්.

**වැඩසටහන් සැලසුම :**

- දිල්ලි හස්ත කර්මාන්ත (IHGF) ප්‍රදර්ශනය වෙත අධ්‍යයන / ක්ෂේත්‍ර චාරිකාව.
- සුවිශේෂිත අත්කම්, තෑගි භාණ්ඩ හා ගෘහ අලංකරණ නිෂ්පාදන කර්මාන්ත ශාලා වෙත කෙරෙනු ලබන චාරිකා.
- ව්‍යාපාරික හමුව / B2B රැස්වීම
- මුම්බායි හි සාධාරණ වෙළඳ (Fair Trade) ගම්මානයක් වෙත කෙරෙන චාරිකාව

**සහභාගිත්ව පිරිවැය :**

සහභාගි වන්නන් විසින් අදාළ සංචාරයේ සියලුම පිරිවැය දැරිය යුතුය. අපනයන සංවර්ධන මණ්ඩලය මගින්, සුළු හා මධ්‍ය පරිමාණ සමාගමක එක් නියෝජිතවරයකු සඳහා වන ගුවන් ගමන් පිරිවැයෙන් හා අභ්‍යන්තර ගමනාගමන වියදම්වලින් කොටසක් දැරීමට සලකා බලනු ඇත.

**අයදුම්පත් :**

අපනයන සංවර්ධන මණ්ඩලයේ කාර්මික නිෂ්පාදන අංශයෙන් (6 වන මහල) ලබාගත හැකි අයදුම්පත් මගින් අයදුම්කළ යුතුය. එසේම, අදාළ අයදුම්පත්, අයතන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය වන www.srilankabusiness.com "Announcements" වෙතින්ද බාගත කළ හැක. යථා පරිදි සම්පූර්ණ කළ අයදුම්පත්, අධ්‍යක්ෂ, කාර්මික නිෂ්පාදන, අපනයන සංවර්ධන මණ්ඩලය වෙත, 2025 දෙසැම්බර් 29 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ තෝරාගැනීම්, අයතන සංවර්ධන මණ්ඩලය විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ඇත.

වැඩිදුර විස්තර සඳහා සංවර්ධන නිලධාරී මංගලා මධුවන්ති මිය - දුරකථන - 0772278196 හෝ අපනයන ප්‍රවර්ධන නිලධාරී ෂර්මිලා හේරත් මිය - දුරකථන - 0786748117 හෝ කාර්මික නිෂ්පාදන අංශය - දුරකථන - 0112302071- ඊමේල් - mangala@edb.gov.lk / shermi@edb.gov.lk වෙතින් ද සම්බන්ධ කරගත හැකිය.


**සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**
**NDB/EDB කුළුන, 42, නවම් මාවත, කොළඹ 02.**
**දුරකථනය : 011-2300705-11, ෆැක්ස් - 011-2300715**
**ඊමේල් : edb@edb.gov.lk**
**වෙබ් අඩවිය : www.srilankabusiness.com**